
3.0 නිපුණතාව

# රජය සමඟ සම්බන්ධතා පවත්වා ගනිමින් ව්‍යාපාර කරගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි.




*ආර් පී හරිස්චන්ද්‍ර කුමාර,*

***B.sc(Ad)J,pura***

***PGDE Colombo***

*ශ්‍රී ධර්මානන්ද විද්‍යායතන පිරුවන,*

*මිරිස්වත්ත*

*බලංගොඩ*

## ඉලක්කය

**පවතින ව්‍යාපාර දියුණු කළ හැකි එමෙන්ම නව ව්‍යාපාර බිහිකළ හැකි හෙට පැවතිය හැකි තත්වය පූර්ව තිරණය කළ හැකි රටට වැඩදායි ව්‍යවසායකත්වයෙන් යුත් පුරවැසියන් බිහිකිරිම.**

## නිපුණතා මට්ටම්

| | කාලච්ඡේද බරතැබිම |
|---|---|
| 3.1) රජය ව්‍යාපාර වලට මැදිහත් වන ආකාරය විමර්ශණය කරයි. | 04/30 |
| 3.2) රජයක ආර්ථික අරමුණු ඉටුකර ගැනීම සඳහා ව්‍යාපාර දායක වන ආකාරය පෙන්වා දෙයි. | 04/30 |
| 3.3) රජයේ ෆිස්කල් ප්‍රතිපත්තිවලට අනුකූලව ව්‍යාපාර පවත්වාගෙන යාමේ වැදගත්කම අගයයි. | 06/30 |
| 3.4 රජයේ මූල්‍ය ප්‍රතිපත්තිවලට අනුකූල ව ව්‍යාපාර පවත්වාගෙන යාමේ වැදගත්කම අගයයි. | 06/30 |
| 3.5 පාරිභෝගික ආරක්ෂණය සඳහා රජය ගන්නා ක්‍රියාමාර්ගවලට අනුගත වෙමින් ව්‍යාපාර පවත්වාගෙන යාමේ අවශ්‍යතාව පෙන්වා දෙයි. | 05/30 |
| 3.6 පාරිභෝගික ආරක්ෂණය සඳහා ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනවල කාර්යභාරය විමසා බලයි. | 05/30 |

## *3.1 රජය, ව්‍යාපාර වලට මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි.*

**ඉගෙනුම් ඵල :**

- ශ්‍රී ලංකාවේ ව්‍යාපාරවලට රජයේ බලපෑම මධ්‍යම රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතන හරහා සිදු වන බව පෙන්වා දෙයි.
- තෝරාගත් ව්‍යාපාර ආයතනයක් නිදසනුක් ලෙස ගෙන එයට මධ්‍යම රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතන මැදිහත් වන ආකාරය වෙන වෙන ම පැහැදිලි කරයි.
- රජය ව්‍යාපාරවලට මැදිහත් වන විවිධ ආකාර පැහැදිලි කරයි.
- රජය ව්‍යාපාරවලට මැදිහත් වන එක් එක් ආකාරය සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- රජයෙන් ව්‍යාපාරවලට ලැබෙන සහාය හා මග පෙන්වීම ව්‍යාපාරවලට වැදගත් වන ආකාරය පැහැදිලි කරයි.

### ශ්‍රී ලංකාවේ ව්‍යාපාරවලට රජයේ බලපෑම.

ඕනෑම රටක ආර්ථිකය මෙහෙයවනු ලබන ප්‍රධාන කාරකය වනුයේ එරට රජයයි. ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කෙරෙහි රාජ්‍ය බලපෑම පහත ආකාර වලින් සිදුවේ.

1. මධ්‍යම රජය

2. පළාත් සභා

3. පළාත් පාලන ආයතන
   - මහ නගර සභා
   - නගර සභා
   - ප්‍රාදේශීය සභා

**ක්‍රියාකාරකම....... 01**

**සිසුන් කණ්ඩායම් 05කට බෙදා පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.**

- පහත දැක්වෙන ව්‍යාපාර එක් එක් කණ්ඩායමට 01 බැගින් ලබා දෙන්න.
  - වී වගා කරන ගොවිපළක්
  - ඇගලුම් අපනයනය කරන ආයතනයක්
  - මගී ප්‍රවාහන සේවා සපයන ආයතනයක්
  - පෞද්ගලික පාසලක්
  - පෞද්ගලික දුරකතන ආයතනයක්

- එක් එක් කණ්ඩායමට ලැබුණු ව්‍යාපාර ආයතනය කෙරෙහි අවධානය යොමු කරවන්න.
- ක්‍රියාකාරකමෙහි යෙදීමට **<u>සිසුන්ට පහත උපදෙස් ලබා දෙන්න.</u>**

➢ ඔබට ලැබුණු ව්‍යාපාරය ඔබ විසින් ම පවත්වා ගෙන යන බවට උපකල්පනය කරන්න.

➢ අදාළ ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා රජයෙන් ලබාගත හැකි සහායයන් සඳහන් කරන්න.

➢ අදාළ ව්‍යාපාර ආයතනය නිවැරදි මාර්ගයේ ගමන් කරවීම සඳහා රජය ලබා දෙන්නා වූ මග පෙන්වීම් දක්වන්න.

➢ එම එක් එක් සහායයන් හා මග පෙන්වීම් ලබා දෙන රජයේ ආයතන ලැයිස්තගුත කරන්න.

➢ එම ආයතන මධ්‍යම රජය, පළාත් සභා, සහ පළාත් පාලන ආයතන යටතේ වර්ග කරන්න.

➢ රජය එම සහායයන් සහ මග පෙන්වීම් සැපයීම වැදගත් වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

❖ **සිසු අනාවරණ නිර්මාණශීලී ව සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න.**

## <u>රජය ව්‍යාපාර වලට මැදිහත්වන විවිධ කරන ආකාර</u>

**01) යටිතල පහසුකම් සැපයන්නකු ලෙස.**

නිදසුන් : මධ්‍යම රජය - විදුලි බලය සැපයීම.

පළාත් සභා - මාර්ග නඩත්තුව.

පළාත් පාලන ආයතන - අපද්‍රව්‍ය ඉවත් කිරීම.

**02) තරගකරුවෙකු ලෙස.**

නිදසුන් : මධ්‍යම රජය - පෞද්ගලික අංශයේ රූපවාහිනී නාලිකා සමග තරගකාරී ව රාජ්‍ය අංශයේ රූපවාහිනි නාලිකා ක්‍රියාත්මක කිරීම.

පළාත් සභා - ඒ ඒ පළාත් සභා යටතේ පෞද්ගලික අංශය හා තරගකාරී ව ව්‍යාපාර පවත්වා ගෙන යාම.

පළාත් පාලන ආයතන - පෞද්ගලික අංශය හා සමාන ව වෙළෙඳසැල් ඉදිකර කුලියට දීම.

**03) ගනුදෙනුකරුවෙකු ලෙස.**

නිදසුන් : මධ්‍යම රජය - වී මිල දී ගැනීම, විවිධ කාර්යාලීය උපකරණ මිල දී ගැනීම, ලක් සතොස හරහා භාණ්ඩ විකිණීම.

පළාත් සභා - ආරක්ෂක සේවා ලබා ගැනීම හා ලබා දීම.

පළාත් පාලන ආයතන - ආදාහනාගාර පවත්වා ගෙන යාම.

**04) ප්‍රතිපත්ති සම්පාදකයකු ලෙස.**

නිදසුන් : මධ්‍යම රජය - මූල්‍ය ප්‍රතිපත්ති හා පිස්කල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

පළාත් සභා - ව්‍යාපාර නාම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.

පළාත් පාලන ආයතන - පරිසර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

**05) නීති රීති පැනවීම මගින්.**

නිදසුන් : මධ්‍යම රජය - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත, ප්‍රමිති පනත.

පළාත් සභා - පෞද්ගලික බස් රථ සඳහා නතීරීති පැනවීම.

පළාත් පාලන ආයතන - ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම හා නීති රීති පැනවීම.

**06) බදු අයකරන්නෙකු ලෙස.**

නිදසුන් : මධ්‍යම රජය - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හරහා බදු අය කිරීම.

පළාත් සභා - පළාත් ආදායම් දෙපාර්තමේන්තුව මගින් බදු අය කිරීම.

පළාත් පාලන ආයතන - වරිපනම් බදු අය කිරීම.

**07) දිරිගැන්වීම් සපයන්නකු ලෙස.**

උදාහරණ :- බදු සහන.
මූල්‍ය පහසුකම්.
අලෙවි පහසුකම්.

## රජය ව්‍යාපාර කෙරෙහි බලපෑම් කිරීමට හේතු

**01 රටේ ආර්ථික කටයුතු කළමනාකරණය කිරීම සඳහා**

**02 සුබසාධන භාණ්ඩ සැපයීමට**

කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් පරිභෝජනයෙන් ධන බාහිරතා ඇති කරන්නේ නම් එය සුබසාධන භාණ්ඩයකි.

උදාහරණ :- රෝහල්

පාසල්

මහජන පුස්තකාල

**03 පොදු භාණ්ඩ සැපයීම සඳහා**

ගෙවීමක් කරනු ලැබුවත් නැතත් සාමූහිකව පරිභෝජනය කළ හැකි පාරිභෝජනයේ තරගකාරීත්වයක් පොදු භාණ්ඩ වේ.

උදාහරණ :- ප්‍රදීපාගාර

හෝරා ස්ථම්භක / ඔරලෝසු කණු

වීදි ආලෝකය

**04 පෞද්ගලික අංශයේ ඒකාධිකාරිත්වය පාලනය කිරීමට.**

**05 යටිතල පහසුකම් සැපයීම සඳහා**

**06 ව්‍යාපෘති සඳහා අවශ්‍ය විවිධ ආධාර සැපයීමට.**

**07 සමාජ හා පරිසර ලැදියාව ආරක්ෂා කිරීම් සඳහා**

**08 වෙළඳ විෂමාචාර වලින් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා**

### රජයෙන් ව්‍යාපාරවලට ලැබෙන සහාය හා මගපෙන්වීම වතපාර වලට වැදගත් වන ආකාරය

01) ව්‍යාපාර ලියාපදිංචියට යොමු වීම.

02) කීර්තිනාමය වර්ධනය වීම.

03) රටේ සංවර්ධනයට දායක වීම.

04) රජයේ හා මහජනයාගේ පිළිගැනීම ලැබීම.

- **ශ්‍රී ලංකාවේ මිශ්‍ර ආර්ථිකයක් පවතින බැවින් රජයේ සහ පෞද්ගලික අංශයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අන්නෝන්‍ය වශයෙන් බැඳී පවතී.**

**නිපුණතා මට්ටම 3.2 ඃ රජයක ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා**

**ව්‍යාපාර දායක වන ආකාරය පෙන්වා දෙයි.**

**ඉගෙනුම් ඵල ඃ**

01) රජයක ආර්ථික අරමුණු විස්තර කරයි.

02) රජයේ ආර්ථික අරමුණු ඉටු කිරීමට ව්‍යාපාර දායක වන ආකාරය පැහැදිලි කරයි.

03) තෝරාගත් ව්‍යාපාරයක් නිදසුන් ලෙස ගෙන එය රජයේ ආර්ථික අරමුණු ඉටු කිරීමට දායක වන ආකාරය පෙන්වා දෙයි.

04) රජයත් ව්‍යාපාරත් අතර අන්‍යොන්‍ය සම්බන්ධතාව තුළින් දෙපාර්ශ්වයේ ම අරමුණු ඉටුකර ගත හැකි බව පෙන්වා දෙයි.

**<u>රජයේ ආර්ථික අරමුණු.</u>**

රජයක් පහත දැක්වෙන ආර්ථික අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කරයි.

❖ ආර්ථික වර්ධනය හා සංවර්ධනය.

නිෂ්පාදන ක්‍රියාවලියේ අඛණ්ඩ වර්ධනය තුළින් ආර්ථික වර්ධනයක් සිදු වන අතර ඊට අමතර ව මානව හා සමාජ දර්ශකවල දිගුකාලීන වර්ධනය සංවර්ධනය ලෙස හඳුන්වයි.

❖ පූර්ණ සේවා නියුක්තිය.

ශ්‍රමය සැපයීමට බලාපොරොත්තුවෙන් සිටින සියලු දෙනා යම් සේවාවක නියුක්ත වී සිටීම මෙන් ම ආර්ථිකය සතු සියලු ම නිෂ්පාදන සම්පත් ඵලදායී නිෂ්පාදන කටයුත්තක යොදවා තිබීම.

❖ සාධාරණ ආදායම් ව්‍යාප්තිය.

රටක සමස්ත නිෂ්පාදිතය එ රටෙහි වෙසෙන සමස්ත ජනතාව අතර සමාන ව බෙදා හැරීම.

❖ ආර්ථික ස්ථායිතාව

ආර්ථිකයේ දේශීය හා විදේශීය වශයෙන් අර්බුදයක් ඇති නො වීමට ඔරොත්තු දීමේ හැකියාව ආර්ථික ස්ථායිතාවයි.

ආර්ථික ස්ථායිතාව කොටස් දෙකකින් යුක්ත වේ.

1. අභ්‍යන්තර මිල ස්ථායිතාව.

අභ්‍යන්තර මිල ස්ථායිතාව තුළින් උද්ධමනය පාලනය, මිල මට්ටම ස්ථාවර ව පවත්වා ගැනීම, පොලී අනුපාතය පාලනය කිරීම සිදු කිරිමයි.

2. බාහිර මිල ස්ථායිතාව.

බාහිර මිල ස්ථායිතාව තුළින් විදේශ විනිමය අනුපාතය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම සිදු කරයි.

❖ යහපත් අන්තර් ජාතික වෙළෙඳාම.

විදේශ වෙළෙඳ කටයුතු සතුටුදායක අන්දමින් පවත්වා ගෙන යාම

තුළින් ගෙවුම් ශේෂ තත්ත්වය ආරක්ෂා කර ගැනීම මින් අපේක්ෂා කරයි.

**ක්‍රියාකාරකම....... 02**

**බලංගොඩ ප්‍රදේශයේ ඇති ඇගලුම් කර්මාන්ත ශාලාවක් උදාහරණ ලෙස ගෙන ඉහත උගත් ආර්ථික අරමුණු ඉටු කිරිමට දායක වන ආකාරය පැහැදිලි කරන්න.**

රජයේ ආර්ථික අරමුණු ඉටු කිරීමට ව්‍යාපාර විවිධාකාරයෙන් දායක වේ.

01) බදු ගෙවීම.

රජයට ගෙවිය යුතු බදු පැහැර හැරීමකින් තොර ව තමා උපයාගත් ලාභය හා ආදායම් මත නියමිත පරිදි  බදු ගෙවීම

02) දේශීය සම්පත් භාවිතය.

හැකිතාක් උපරිමයෙන් තම නිෂ්පාදන සඳහා දේශීය සම්පත් යොදා ගැනීම.

03) රජය ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති පිළිපැදීම.

රජය ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය හා පිස්කල් ප්‍රතිපත්ති නිසි පරිදි ක්‍රියාත්මක කිරීම හා පිළිපැදීම

04) නීති රීති පිළිපැදීම.

ව්‍යාපාර සඳහා පනවා ඇති නීති රීති ඒ ආකාරයෙන් ඉටු කරමින් යහපත් ව්‍යාපාරික පරිසරයක් ගොඩනැගීමට දායක වීම

05) සේවා නියුක්තියට දායක වීම.

ඵලදායී ලෙස නිෂ්පාදන කටයුතු කිරීමේ දී ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් ඇතුළු සියලු සම්පත් කාර්යක්ෂම ව භාවිතයට ගැනීම

06) පරිසරයට වන හානිය අවම කිරීම.

සියලු ව්‍යාපාර පරිසර හිතකාමී ලෙස ඒවායේ ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම.

**රජයේ ආර්ථික අරමුණු ඉටුකර ගැනිමට ව්‍යාපාරික ප්‍රජාව දායක වන ආකාරය සහ එමඟින් ඉටුවන ආර්ථික අරමුණු.**

| දායක වන ආකාරය. | ඉටුවන ආර්ථික අරමුණු. |
|---|---|
| 01 නිසි නිසි පරිදි බදු ගෙවීම. | සාධාරණ ආදායම් ව්‍යාප්තිය.<br>ආර්ථික වර්ධනය හා සංවර්ධනය. |
| 02 සේවා නියුක්තියට දායක වීම. | ආර්ථික වර්ධනය හා සංවර්ධනය.<br>පූර්ණ සේවා නියුක්තිය.<br>සාධාරණ ආදායම් ව්‍යාප්තිය. |
| 03 නීති රීති පිළිපැදීම. | ආර්ථික වර්ධනය හා සංවර්ධනය.<br>පූර්ණ සේවා නියුක්තිය. |
| 04 පරිසරයට වන හානිය අවම කිරීම. | තිරසර සංවර්ධනය. |
| 05 දේශීය සම්පත් භාවිතා කිරීම. | ආර්ථික වර්ධනය හා සංවර්ධනය.<br>පූර්ණ සේවා නියුක්තිය. |
| 06 සමාජ සුභසාධනයට දායකවීම. | තිරසාර සංවර්ධනය. |

## රජය හා ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය.

- රජය ව්‍යාපාර වලට අවශ්‍ය පහසුකම් සැපයීම තුලින් ව්‍යාපාර දිරිමත් වේ.
- ව්‍යාපාර වර්ධනය තුළින් රජයේ අරමුණු ඉටු වේ.
- ව්‍යාපාර වර්ධනය නිසා රජයට බදු ආදායමක් ලබා ගත හැකි ය.
- එම ආදායම් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා හා අනෙකුත් කාර්යයන් සඳහා යොදාගත හැකි ය.
- මේ නිසා රජයත් ව්‍යාපාරත් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම අවශ්‍ය වේ.

නිපුණතා මට්ටම 3.3 : රජයේ පිස්කල් ප්‍රතිපත්තිවලට අනුකූල ව ව්‍යාපාර පවත්වාගෙන යාමේ වැදගත්කම අගයයි.

ඉගෙනුම් ඵල :

- රජයේ පිස්කල් ප්‍රතිපත්තිය යන්න පැහැදිලි කරයි.
- රජයේ පිස්කල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙයි.
- රජයේ ආදායම් හා වියදම් ව්‍යුහය රූප සටහනකින් දක්වයි.
- බදු වර්ග කොට එක් එක් බදු වර්ගය සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- රජයේ බදු නො වන ආදායම් සඳහා නිදසුන් දක්වයි.
- ආසනන් ම වර්ෂයේ අය වැය යෝජනා සැලකිල්ලට ගෙන ඒවා ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම විග්‍රහ කරයි.

## ආර්ථික ප්‍රතිපත්ති

රජයේ ආර්ථික අරමුණු මුදුන් පමුණුවා ගැනීම පිණිස රජය විසින් ක්‍රියාවට නංවන උපකරණ ආර්ථික ප්‍රතිපත්ති වෙයි. රජයේ ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්ති 02කි.

01 ෆිස්කල් ප්‍රතිපත්තිය / අයවැය ප්‍රතිපත්තිය / බදු ප්‍රතිපත්තිය / රජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය.
02 මූල්‍ය ප්‍රතිපත්තිය.

## ෆිස්කල් ප්‍රතිපත්තිය

රාජ්‍ය ආදායම සහ රාජ්‍ය වියදම පිළිබඳව රජය සිදු කරන කටයුතු ෆිස්කල් ප්‍රතිපත්තියයි.

- සාර්ව ආර්ථික ස්ථායිතාවය ආරක්ෂා කිරීම මෙහි ප්‍රධාන අරමුණයි.
- මෙම ප්‍රතිපත්තිය සකස් කිරීමේ මූලික වගකීම මුදල් අමාත්‍යාංශය නැතහොත් මහා භාණ්ඩාගාරය විසින් දරන අතර ඒ සඳහා අනුමැතිය පාර්ලිමේන්තුවෙන් ලබාගත යුතුය.

## රාජ්‍ය ආදායම

යම් ආර්ථිකයක මුදල් වර්ෂයක් තුළ සියලු මාර්ග වලින් ලැබෙන අයභාරය රාජ්‍ය ආදායමයි. මෙය ප්‍රධාන කොටස් 02කි.

01 බදු ආදායම

02 බදු නොවන ආදායම

බද්දක් යනු

යම් පුද්ගලයකු හෝ ආයතනයක් විසින් අනිවාර්යයෙන් ම ගෙවිය යුතු යැයි රජය හෝ රජයේ බලාධිකාරී ආයතනයක් විසින් නියම කරනු ලබන ගෙවීමකි.

## රජයේ බදු ආදායම පහත පරිදි වර්ග කළ හැකි ය.

ආදායම් බදු : පුද්ගලයින්ගේ හා ආයතනවල ආදායම මත අයකරනු ලබන බද්දකි.

නිදසුන් : සමාගම් බදු, උපයන විට ගෙවීම් බදු

එකතු කළ අගය : භාණ්ඩ හා සේවා මත එකතු කළ වටිනාකමට අය කරන බදු මත බදු එකතු කළ මත බදු අගය මත බදු වේ.

නිදසුන් : තොග හා සිල්ලර වෙළෙඳාම මත එකතු කළ අගය මත බදු ආනයන මත එකතු කළ අගය මත බදු

නිෂ්පාදන බදු/ දේශීය භාණ්ඩ බදු දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ඇතැම් භාණ්ඩ මත අය කරන බදු

නිදසුන් : සිගරට් හා දුම්කොල නිෂ්පාදන මත බදු, සුරා බදු

ආනයන මත බදු : විදේශීය රටවල්වලින් ආනයනය කරන භාණ්ඩ සඳහා රේගුවේ දී අය කරන බදු වේ.

නිදසුන් : මෝටර් රථ ආනයන මත බදු

අනෙකුත් බදු : ඉහත බදු වර්ගවලට අයත් නො වන එහෙත් අනෙකුත් පාර්ශ්වවලින් අයකරන බදු වර්ග ය.

නිදසුන් : වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු සෙස් බද්ද, විදුලි සංදේශ බදු

## බදු වර්ගීකරණය කිරීම

බදු බර විතැන් කිරීමේ හැකියාව අනුව (බදු අනුපාතය විතැන් කිරීමේ හැකියාව අනුව) බදු ප්‍රධාන කොටස් දෙකකි.

### 01) සෘජු බදු

කිසියම් පුද්ගලයකුගේ හෝ ව්‍යාපාර වල ආදායම හා වත්කම් මත පුද්ගලයා හෝ ආයතනය විසින්ම ගෙවන බදුය. නැතහොත් නෛතික වශයෙන් බද්ධට යටත් වන පුද්ගලයාට හෝ ආයතනය විසින් ගෙවිය යුතු වන එය වෙනත් කෙනෙකුට විතැන් කළ නොහැකි බද්ධකි.

උදාහරණ:- පෞද්ගලික ආදායම් බදු

සමාගම් ලාභ බදු

රදවාගැනිමේ බදු

ප්‍රාග්ධණ ලාභ බදු

### 02) වක්‍ර බදු

භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, පරිභෝජනය සහ වියදම මත අයකරන බදුයි. මෙම බදු බර විටතැන් කළ හැක. නැතහොත් නෛතික වශයෙන් බද්දට යටත් වන පුද්ගලයාට එම බද්ධ වෙනත් කෙනෙකුට පැවරිය හැකි නම් එය වක්‍ර බද්ධකි.

උදාහරණ:- එකතු කල අගය මත බදු

රේගු බදු

නිෂ්පාදන බදු

## රජයේ බදු නොවන ආදායම් මූලාශ්‍ර

01) රාජ්‍ය ව්‍යවසායන්ගේ ලාභ හා ලභාංශ

02) ජාතික ලොතරැයි අරමුදල්

03) පොලී ආදායම්

04) ගාස්තු හා අයකිරීම්

**ක්‍රියාකාරකම....... 03**

ආසන්න වර්ශයේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවට අනුව රාජ්‍ය ආදායම බදු ආදායමෙන් ලැබී ඇති දායකත්වයේ බදු හා බදු නොවන ප්‍රතිශතයන් වෙන වෙනම දක්වන්න.

- ශ්‍රී ලංකා මහ බැංකු වාර්තිවේ උදාහරණයන් සිසුන්ට ලබා දී පහත දෑ වල ප්‍රතිශත ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දෙන්න

බදු ආදායම

- ආදායම් බදු
- එකතු කළ අගය මත බදු
- නිෂ්පාදන බදු
- ආනයන මත බදු
- අනෙකුත් බදු

බදු නොවන ආදායම


ලාභ හා ලාභාංශ

ගාස්තු හා අයකිරීම්

පොළි ආදායම

වෙනත්

**රජයේ ආදායම් සංයුතිය පහත ගැලීම් සටහන මගින් තව දුරටත් පැහැදිලි කර ගත හැකිය**



**රාජ්‍ය ආදායම් රැස් කිරීම සම්බන්ධව ක්‍රියා කරන ප්‍රධාන ආයතන සහ එමගින් රැස් කරන බදු වර්ග**

| ආයතන | බදු වර්ග | |
|---|---|---|
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | ආදායම් බදු | සමාගම් බදු |
| | සමාගම් ලාභාංශ බදු | උපයන විට ගෙවීම් බදු |
| | රඳවා ගැනීමේ බදු | ඔට්ටු හා සූදුබදු |
| | මුද්දර ගාස්තු | ආර්ථික සේවා ගාස්තු |
| | ජාතිය ගොඩනැගීමේ බද්ධ | |
| රේගු දෙපාර්තමේන්තුව | තීරුබදු | |
| | වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු | |
| සුරාබදු දෙපාර්තමේන්තුව | දුම් කොළ හා මධ්‍යසාර බදු | |
| මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව | මෝටර් රථ ලියාපදිංචි කිරීමේ බදු | |
| | මෝටර් රථ පැවරුම් බදු | |
| | මාදිලි වෙනස් කිරීම් බදු | |
| පළාත් පාලන ආයතන | වරිපනම් බදු | |
| | විනෝද බද්ධ | |
| | පිරිවැටුම් බදු | |
| | ව්‍යාපාරික ස්ථාන බදු | |
| පළාත් සභා | ආදායම් බලපත්‍ර ගාස්තු | |

## රජය විසින් පන වන බදූ ව්‍යාපාර කෙරෙහි සිදූ කෙරෙන විවිධ බලපෑම්

1) භාණ්ඩ හා සේවා මත බදු පැනවීම නිසා භාණ්ඩ වල මිල ඉහල යාමේන් ඉල්ලුම අඩුවී විකුනුම් අඩුවී ලාභය අඩුවිය හැකිය.

2) යෙදවුම් වල මිල ඉහල යාම හෙතුවෙන් නිෂ්පාදන පිරිවැය ඉහල යාම.

3) ව්‍යාපාරවලින් අයකරන සෘජු බදු (සමාගම් බදු) හෙතුවේන් ව්‍යාපාරයේ ලාභය අඩු වන අතර ප්‍රතිආයෝජනය කිරිමට නොහැකි විමෙන් ව්‍යාපාර කටයුතු අධෛර්යමත් විමක් සිදු වේ.

4) VAT වැනි වක්‍ර බදු පිලිබඳ ගනුදෙනු පියවිම හා ලබා ගැනිමේ කටයුතු ව්‍යාපාර කලයුතු නිසා ඔහුන්ට අතිරේක වියදමක් හා කාලයක් ගතවිම.

5) රට තුල උද්ධමනකාරි තත්වයක් නිර්මානය විම හේතුවෙන් වැටුප් වැඩි විම් ඉල්ලා සෙවකයන් උද්ඝෝෂණය කල හැකි අතර වැටුප් වැඩි විමේන් පිරිවැය ඉහල යාම හා ලාභ අඩු විය හැකිය.

## රජයක් ව්‍යාපාරිකයින්ට බදූ දිරිගැන්විම් ලබාදිමේ ප්‍රධාන අරමුණු

1) දේශිය ආයෝජන දිරි ගැන්විම.

එනම් බදු දිරිගැන්වූ අංශයන් හි ආයෝජනය කිරීම වාසිදායක වීම නිසා ව්‍යාපාරිකයන්ට ඒ කෙරෙහි නැඹුරු වීම ට අපේක්ෂා කරයි.

2) රැකියා අවස්ථා බිහි කිරීම.

බදු දිරි ගැන්වීම නිසා පවතින ව්‍යාපාර වර්ධනය වීම ද නව ව්‍යාපාර ඇතිවීමද මගින් රැකියාවක් බිහිකිරීම මේ තුලින් අපේක්ෂා කරයි.

3) විදේශ ආයෝජන රට තුළට ගෙන්වා ගැනීම.

ඉතුරුම් හිඟයට පිළියම් ලෙසත් ආයෝජන වැඩි කර කර ගැනීම සඳහාත් වෙනත් රටවලට වඩා සුවිශේෂ දිරිගැන්වීම් ලබා දීම මගින් විදෙශ ආයෝජන රට තුළට අද්දවාගැනීම අපේක්ෂා කරයි.

## රාජ්‍ය වියදම

කිසියම් කාලපරිච්ඡේදයක් තුල හෝ වර්ෂයක් තුළ රටේ ප්‍රජාව වෙනුවෙන් රජය වියදම් කරන සියලු මුදල් ප්‍රමානය නැතහොත් රජයක් එදිනෙදා කටයුතු පවත්වාගෙන යාමේ හා ආර්ථික වර්ධනය සඳහා වර්ශයක් තුලදි දරන්නා වු මුලු වියදමයි.

එනම් රටක ආර්ථික ක්‍රියාකාරකම් වෙනුවෙන් මධ්‍යම ආණ්ඩුව, පළාත් සභා, පාළාත් පාලන ආයතන විසින් දරණ වියදමයි.

රාජ්‍ය වියදම ප්‍රධාන කොටස් 02කට බෙදිය හැක.

01) වර්තන වියදම් / පුනරාවර්තන වියදම්

රාජ්‍ය සේවා කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වසරක් තුල නැවත නැවත දැරීමට සිදු වන වියදම්ය.

නිදසුන් වැටුප් හා වේතන

පොළී ගෙවීම්

02) ප්‍රාග්ධන වියදම් / රාජ්‍ය ආයෝජන වියදම්

රජයක් විසින් දිගුකාලින ආයෝජන සඳහා දරන වියදම් ය.

නිදසුන් :- මහා මාර්ග හා පාලම් ඉදිකිරිම

**රජයේ පිස්කල් ප්‍රතිපත්තිය ව්‍යාපාරවලට බලපාන ආකාරය**

1) ආනයනික භාණ්ඩ සඳහා රේගු බදු අය කිරීමෙන් ආනයන සීමා වන අතර ම දේශීය නිෂ්පාදනය වර්ධනය කර ගත හැකි ය. /දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගත හැකි වේ.

2) දේශීය නිෂ්පාදිත මත බදු අය කිරීමෙන් භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යාම සිදු විය හැකි ය.

3) රජය, යටිතල පහසුකම් මත වියදම් දැරීම නිසා ව්‍යාපාරික කටයුතු පහසු කෙරේ.

නිපුණතා මට්ටම 3.4 : රජයේ මූල්‍ය ප්‍රතිපත්තිවලට අනුකූල ව ව්‍යාපාර පවත්වා ගෙන යාමේ වැදගත්කම අගයයි.

ඉගෙනුම් ඵල :

- රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය පැහැදිලි කරයි.
- රජයේ මූල්‍ය ප්‍රතිපත්තිවල අරමුණ විස්තර කරයි.
- රටක මූල්‍ය කටයුතු පාලනය සඳහා රජයකට අනුගමනය කළ හැකි උපාය මාර්ග පෙන්වා දෙයි.
- රජය අනුගමනය කරනු ලබන එක් එක් මූල්‍ය පාලන උපකරණය (උපක්‍රමය) පැහැදිලි කරයි.
- රජය අනුගමනය කරන මූල්‍ය පාලන උපක්‍රම ව්‍යාපාරවලට බලපාන ආකාරය විග්‍රහ කරයි.

# <u>මූල්‍ය ප්‍රතිපත්තිය</u>

රටක මුදල් සැපයුම පාලනය කිරීම සඳහා රජය අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තියයි රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකු විසින් මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවයි.

- ❖ රජයේ මුල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ දේශීය ආර්ථිකයේ මිල ස්ථායිතාවය පවත්වාගෙන යාමයි.
- ❖ එහිදි දිගු කාලයක් පුරා මිල මට්ටම් ස්ථාවර මට්ටමක පවත්වා ගෙන යාම අපෙක්ෂා කරයි

**<u>මුල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැන්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාවිතා කරන උපකරණ</u>**

01) පොලී අනුපාතය

02) සංචිත අවශ්‍යතා වෙනස් කිරීම.

03) විවට / විවෘත වෙළෙඳපළ කටයුතු

04) වට්ටම් අනුපාත වෙනස් කිරීම

05) ණය සීමා පැනවීම

**<u>පොලි අනුපාතිකය</u>** (නිත්‍ය පහසුකම් අනුපාත)

රජයේ  මුදල් පාලනය සඳහා යොදා ගනු ලබන ප්‍රධාන උපකරණය පොලී අනුපාතය වේ. නිත්‍ය පහසුකම් අනුපාතිකයේ ප්‍රධාන කොටස් තුනකි.

- **නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය Standing Deposit Facility Rate (SDFR)**

වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් ඔවුන්ගේ අතිරික්ත අරමුදල් මහ බැංකුවේ ඇති රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමේ දී ගෙවනු ලබන පොලී අනුපාතිකයයි.

- **නිත්‍ය ණය පහසකුම් අනුපාතය Standing Lending Facility Rate (SLFR)**

වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් රජයේ සුරැකම්පත් ඇපයට තබා මහ බැංකුවෙන් අරමුදල් ලබා ගැනීමේ දී අය කරනු ලබන පොලී අනුපාතයයි.

- **බැංකු පොලී අනුපාතිකය**

ද්‍රවශීලතා  දුෂ්කරතා වලට මුහුණ දෙන වාණිජ බැංකුවලට ශ්‍රී ලංකා මහ බැංකුව අවසාන ණය දෙන්නා ලෙස සපයනු ලබන ණය සඳහා අය කරනු ලබන  පොලී අනුපාතයයි.

- ❖ මහ බැංකුව බැංකු පොලී අනුපාතය ඉහළ දැමූ විට රටේ සමස්ථ මුදල් සැපයුම අඩු වේ.
- ❖ මහ බැංකුව බැංකු පොලී අනුපාතය පහළ දැමූ විට රටේ සමස්ථ මුදල් සැපයුම වැඩි වේ.

## සංචිත අවශ්‍යතා වෙනස් කිරීම

වාණිජ බැංකුවල පවතින තැන්පතුවලට අදාළ ව  මහ බැංකුවේ පවත්වා ගත යුතු තැන්පතු ප්‍රමාණය  ව්‍යවස්ථාපිත සංචිතය වේ.

- සංචිත අවශ්‍යතා අඩු කිරීම මුදල් සැපයුම වැඩි වීමට හේතු වේ.
- සංචිත අවශ්‍යතා වැඩි කිරීම මුදල් සැපයුම් අඩු වීමට හේතු වේ.

## විවෘත වෙළෙඳපොළ කටයුතු (විවට වෙළෙඳපොළ කටයුතු )

මහ බැංකුව විසින් රජයේ සුරකුම්පත් මිලට ගැනීම හා විකිණීම විවෘත වෙළෙඳපොළ කටයුතු වේ.

- මහ බැංකුව සැරකුම්පත් මිලට ගැනීමේ දී මුදල් සැපයුම ප්‍රසාරණය වේ.
- මහ බැංකුව සැරකුම්පත් විකිණීමේ දී මුදල් සැපයුම සංකෝචනය වේ.

## වට්ටම් අනුපාත වෙනස් කිරීම.

මහ බැංකුව විසින් නිකුත් කරන සුරකුම්පත් මිල දී ගත් පාර්ශ්ව ඒවා කල් පිරීමට පෙර වාණිජ බැංකුවලට ඉදිරිපත් කර වට්ටම් කරවා ගැනීමේ දී අය කරන වට්ටම් අනුපාතිකය වෙනස් කිරීම තුළින් ආර්ථිකයේ මුදල් සැපයුම පාලනය  කළ හැකි වේ.

## ණය සීමා පැනවීම

ණයසීමා පැනවිම දෙයාකාරයකට සිදු වේ.

01) ප්‍රමාණාත්මක ණය සීමා පැනවීම.

රටේ සමස්ථ මුදල් සැපයුමට බලපෑමක් ඇති කරන බැංකු ණය ප්‍රමාණය අඩු හා වැඩි කරමින්  සමස්ථ ණය ප්‍රමාණය පාලනය කිරීම ප්‍රමාණාත්මක ණය පාලනය වේ.
නිදසුන් : වාණිජ බැංකවුල ප්‍රග්ධනය හා වතක්ම් අතර අවම අනුපාත නියම කිරීම.
ණයවර ලිපි නිකුත් කිරීමේ දී තැන්පත් කළ යුතු අවම මුදල් ප්‍රමාණය නියම කිරීම

02) ගුණාත්මක ණය සීමා පැනවීම.

ආර්ථිකයක ණය ගලා යන දිශාව පාලනය කිරිම නැතහොත් ආර්ථිකයේ දිරි ගැන්විය යුතු යයි තෝරා ගත් අංශ සඳහා ණය ගලා යාම දිරිමත් කිරීමත්, අධෛර්යමත් විය යුතු අංශ කෙරෙහි ණය ගලා යාම සීමා කිරීමත් අරමුණු කොට ගෙන ක්‍රියාත්මක වන ක්‍රමය ගුණාත්මක ණය පාලනයයි.
නිදසුන් : ණය ලබා දෙන ක්ෂේත්‍ර නිර්දේශ කිරීම.
කෘෂිකර්මාන්තය සඳහා ද? කර්මාන්ත සඳහා ද ? ව්‍යාවසායකයන් සඳහා ද ? ආදී වශයෙන්.

## මූල්‍ය උපකරණ ක්‍රියාවට නන්වන විට රටේ මුදල් සැපයුමට සිදුවන බලපැම.

| උපකරණය | මුදල් සැපයුම ප්‍රසාරණය / මුදල් සැපයුම වැඩි කිරිම | මුදල් සැපයුම සංකොචනය / මුදල් සැපයුම අඩු කිරිම |
|---|---|---|
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය | සංචිත අවශ්‍යතා පහළ දැමීම | සංචිත අවශ්‍යතා ඉහළ දැමීම |
| විවට වෙළෙඳපොළ කටයුතු | සුරකුම්පත් මිලදී ගැනීම | සුරකුම්පත් විකිණීම |
| බැංකු පොලී අනුපාතය | බැංකු පොලී අනුපාතය පහළ හෙලීම | බැංකු පොලී අනුපාතය ඉහළ දැමීම් |
| බැංකු ණය පාලනය | ලිහිල් කිරීම් හෝ අඩු කිරීම | දැඩි කිරීම හෙවත් වැඩි කිරිම |

## මූල්‍ය ප්‍රතිපත්තිය ව්‍යාපාර වලට බලපාන ආකාරය

රජයේ මුල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී ඒවා ව්‍යාපාරවලට විවිධ ස්වරූපයෙන් බලපෑම් කරයි.

01) මහ බැංකු පොලී අනුපාතිකය අඩු කිරීමත් සමග වාණිජ බැංකු පොලී අනුපාතිකය ද අඩු වේ. එවිට ආයෝජකයින් වාණිජ බැංකු මගින් ලබාගන්නා ණය ප්‍රමාණය වැඩි වීමත් සමඟ ආයෝජන ද වැඩි වේ. ඒ තුළින් නිෂ්පාදනය වැඩි වී භාණ්ඩ මිල අඩු වේ. මිල අඩු වීම නිසා ව්‍යාපාරවල පිරිවැටුම වැඩි වී ලාභ වැඩි වේ.

02) මහ බැංකු පොලී අනුපාතිකය වැඩි කිරීමත් සමග වාණිජ බැංකු පොලී අනුපාතිකය ද වැඩි වේ. එවිට ආයෝජකයින් වාණිජ බැංකු මගින් ලබා ගන්නා ණය ප්‍රමාණය අඩු වීමත් සමග ආයෝජනය ද අඩු වේ. එවිට නිෂ්පාදනය අඩු වී භාණ්ඩ මිල වැඩි වේ. මිල වැඩි වීම නිසා ව්‍යාපාරවල පිරිවැටුම අඩු වී ලාභ අඩු වේ.

03) සංචිත අවශ්‍යතා පහත හෙලන විට බැංකුවලට සැපයිය හැකි ණය ප්‍රමාණය වැඩිවීම නිසා රටේ සමස්ත ආයෝජන ඉහළ යාම.

04) රජයේ සුරැකුම්පත් අලෙවි කරන විට නව ආයෝජන අවස්ථා ඇතිවීම.

නිපුණතා මට්ටම 3.5 : පාරිභෝගික ආරක්ෂණය සඳහා රජය ගන්නා ක්‍රියාමාර්ගවලට අනුගත වෙමින් ව්‍යාපාර පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව පෙන්වා දෙයි.

ඉගෙනුම් ඵල :

- පාරිභෝගික ආරක්ෂණය යන සංකල්පය පහැදිලි කරයි.
- පාරිභෝගික ආරක්ෂණය වඩාත් වැදගත් වීමට හේතු දක්වයි.
- පාරිභෝගික ආරක්ෂණයෙන් පාරිභෝගිකයාට හා ව්‍යාපාරිකයාට ඇති වන වාසි වෙන වෙන ම ලැයිස්තුගත කරයි.
- පාරිභෝගික අයිතිවාසිකම් පැහැදිලි කරයි.
- පාරිභෝගික වගකීම් පැහැදිලි කරයි.
- පාරිභෝගික අයිතිවාසිකම් හා වගකීම් මත තාර්කික පාරිභෝගිකයෙකුගේ හැසිරීම විස්තර කරයි.

**ක්‍රියාකාරකම....... 05**

- සිසුන් කණ්ඩායම් 04කට බෙදන්න.
- පහත දැක්වෙන්නේ පුවත්පත් කිහිපයකින් උපුටා ගත් උපුටන කිහිපයක් ලෙස ප්‍රකාශ කරමින් එම ප්‍රකාශනය බැගින් සිසුන්ට ලබා දෙන්න.
- කණ්ඩායම් වලට ලැබුනු ප්‍රකාශය කෙරෙහි අවධානය යොමු කරවන්න.

ප්‍රකාශ අංක 1 පාන් පිටි මිශ්‍ර කරන ලද තුනපහ පැකට් තොගයක් වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට සූදානම් කරමින් සිටි පිරිසක් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

ප්‍රකාශ අංක 2 භාණ්ඩ මිල දී ගැනීමෙන් පසු ඉතිරි මුදල් ආපසු නො දී ඒ වෙනුවට ගිණිපෙට්ටි, ටොෆී වැනි වෙනත් භාණ්ඩයක් පාරිභෝගිකයාට ලබා දෙන බවට පැමිණිලි ලැබී ඇත.

ප්‍රකාශ අංක 3 SLS සහතිකය නොමැති ව පානීය ජලය ඇසුරුම් කිරීමට භාවිත කරනු ලබන බඳුන් හා බෝතල් වෙළෙඳපොළේ පවතින බවට සිදු කරන ලද විමර්ශනයක දී සොයා ගෙන ඇත.

ප්‍රකාශ අංක 4 කෘමිනාශක හා රසායනික පොහොර යොදා වගා කර අලෙවිය සඳහා වෙළෙඳපොළට ඉදිරිපත් කර තිබූ දොඩම් ගෙඩිවල අලවා තිබූ ස්ටිකරයේ අංකය ව්‍යාජ ලෙස වෙනස් කර අලෙවි කළ පුද්ගලයෙක් අත්අඩංගුවට ගෙන ඇත.

- **පහත උපදෙස් ලබාදෙමින් සිසුන් මෙහෙයවන්න.**
  - ඔබගේ කණ්ඩායමට ලැබුණු සිද්ධිය පිළිබඳ ව කණ්ඩායම් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - එම සිද්ධිවල ඇතුළත්, ව්‍යාපාරිකයින් විසින් සිදු කරන ලද වෙළෙඳ විෂමාචාර හඳුනාගන්න.
  - එම විෂමාචාරවලට අමතර ව ඔබ දන්නා වෙනත් වෙළෙඳ විෂමාචාර මොනවා ද ?
  - එවැනි විෂමාචාර පිළිබඳ ව පැමිණිලි කළ හැකි ආයතන හා පුද්ගලයන් නම් කරන්න.
  - සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කරවන්න.

**දැන් පාරිභෝගික ආරක්ෂණය හා එහි අවශ්‍යතාව පැහැදිලි කරන්න.**

## පාරිභෝගික ආරක්ෂණය

පාරිභෝගිකයා ගෙවන මුදලට ප්‍රමාණවත් තෘප්තියක් ලබා දීම සහතික කිරීම පිණිස සලසා ඇති නීතිමය ආවරණය පාරිභෝගික ආරක්ෂණය වේ.

### වර්තමානයේ පාරිභෝගික ආරක්ෂණය වඩාත් වැදගත් වීමට හේතු

01) වෙළෙඳපොළ තුළ භාණ්ඩ හා සේවා බහුල වීම.

02) තරඟකාරිත්වය වැඩි වීම නිසා වෙළෙඳපොළ තුළ විෂමාචාර ඇති වීමට ඉඩ වැඩි වීම.

03) නිදහස් වෙළෙඳාම සමග වෙළෙඳපොළ සංකීර්ණ වීම.

04) ගෝලීයකරණය සමග ඇති විය හැකි සමාජ හා සංස්කෘතික පිරිහීම.

05)පරිසරය දූෂණය වීම වැළැක්වීම සඳහා පාරිභෝගිකයින් දැනුවත් කිරීම අවශ්‍ය විම.

06) තාක්ෂණික දියුණුව.

07) රාජ්‍ය සේවා පෞද්ගලිකරණය කිරීම.

08) ශක්තිමත් පාරිභෝගික සංවිධාන නොමැතිවීම.

### පාරිභෝගික ආරක්ෂණයේන් පාරිබෝගිකයාට හා ව්‍යාපාරිකයාට අත්වන වාසි

**පාරිභෝගිකයාට**

1) ගෙවන මුදලට සරිලන වටිනාකමක් ලැබෙන භාණ්ඩ පාරිභෝජනයට අවස්ථාව ලැබීම.

2) වෙළෙඳ විෂමාචාරවලින් ආරක්ෂා වීම.

3) ගුණාත්මක භාණ්ඩ හා සේවා පාරිභෝජනය නිසා පාරිභෝගික සෞඛ්‍යය හා ආරක්ෂාව තහවුරු වීම.

4) අවශ්‍ය අවස්ථාවල දී පාරිභෝගික ආරක්ෂණය නිසා නීතිමය රැකවරණ ලබා ගත හැකි වීම.

5) පාරිභෝගිකයාට ජීවත් වීමට සුදුසු පරිසර තත්ත්වයන් උදා වීම.

6) පාරිභෝගික අධ්‍යාපනය ලබාගත හැකිවිම.

7) ගුණත්වයෙන් උසස් මෙන්ම සාධාරණ මිලට භාණ්ඩ ලබා ගත හැකි විම.

**ව්‍යාපාරිකයාට**

1) ගුණාත්මක තත්ත්වයෙන් යුක්ත භාණ්ඩ සැපයීම නිසා පාරිභෝගික විශ්වාසය දිනා ගත හැකි වීම.

2) ව්‍යාපාරිකයාගේ පිරිවැටුම වැඩි වීම තුළින් ලාභය ඉහළ යාම.

3) ප්‍රමිතියකට අනුව නිෂ්පාදනය කිරීම නිසා අපතය අඩු වීම.

4) අයහපත් තරඟ විරෝධී ක්‍රියා නො මැති වීමෙන් යහපත් ව්‍යාපාර පරිසරයක් ඇති වීම.

5) වෙළඳපල සම්බන්ධතා වර්ධනය වීම.

6) පාරිභෝගික පැමිණිලි අවම වීම.

## පාරිභෝගික අයිතිවාසිකම්

ගෙවන මුදලට සාධාරණ තෘප්තියක් ලැබීම තහවුරු කිරීම සඳහා පාරිභෝගිකයා වෙත ප්‍රකාශ කර ඇති හිමිකම් පාරිභෝගික අයිතිවාසිකම් වේ.

අන්තර්ජාතික වශයෙන් පිළිගෙන ඇති පාරිභෝගික අයිතිවාසිකම් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රධාන පාර්ශව දෙකකි

**01** ඇමරිකා එක්සත් ජනපදය ජනාධිපතිවරයකු වූ ජෝන් එෆ් කෙනඩි මහතා
**02** පාරිභෝගික ජාත්‍යන්තරය

- **පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ ප්‍රථමයෙන් ප්‍රකාශ කරන ලද්දේ ජෝන් එෆ් කෙනඩි මහතාය. ඒ 1962 මාර්තු 15 වන දින එම දිනයි. එම දිනය සමරනු වස් ජගත් පාරිභෝගික දිනය හෙවත් පාරිභෝගික අයිතිවාසිකම් දිනය මාර්තු 15 වන දින සැමරේ.**

## අන්තර් ජාතික වශයෙන් පිළි පිළිගැනෙන ජෝන් එෆ් කෙනඩි මහතා විසින් ප්‍රකාශයට පත් කරන ලද පාරිභෝගික අයිතිවාසිකම් හතරකි

01) ආරක්ෂාව සලසා ගැනීමට ඇති අයිතිය.

සෞඛ්‍යයට හා ජීවිතයට හානි කරවන භාණ්ඩ හා සේවා සැපයීමෙන් හෝ වෙළඳාමින් ආරක්ෂා වීමට ඇති අයිතියයි.

02) තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය.

වංක හෝ නොමඟ යවන සුළු කටයුතු වලින් ආරක්ෂා වීම හා නැණවත් තෝරා ගැනීමක් සඳහා ඉවහල්වන සත්‍ය තොරතුරු දැන ගැනීමට ඇති අයිතියයි.

03) තෝරා ගැනීමට ඇති අයිතිය.

තරගකාරි මිලගණන් යටතේ උසස් ප්‍රමිතීන් ගෙන් යුත් භාණ්ඩ හා සේවා තෝරා ගැනීමට ඇති අයිතියයි.

04) සවන් යොමු කරවා ගැනීමට ඇති අයිතිය.

රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේදී පාරිභෝගික අවශ්‍යතාවයන් සහ අදහස් උදහස් ඉදිරිපත් කිරීමට හා ඒවාට ඇහුම්කන් ලබා දීමත් ලබාගැනීමට ඇති අයිතියයි.

**පාරිභෝගික ජාත්‍යන්තරය නම් පාරිභෝගික සංවිධානය විසින් අවධානය කෙරෙන පාරිභෝගික අයිතිවාසිකම් 08කි. ඉහත අයිතිවාසිකම් 04ට අමතරව පහත අයිතිවාසිකම් 04 ද ඊට ඇතුළත් වේ.**

05) මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය.

පාරිභෝගිකයින්ගේ පැවැත්ම තහවුරු කෙරෙන මූලික අවශ්‍යතා වන ආහාරපාන ඇඳුම් නිවාස සනිපාරක්ෂක සේවා යනාදිය ලබා ගැනීමට ඇති අයිතියයි.

06) වන්දි ලබාගැනීමට ඇති අයිතිය.

අසතුටුදායක සේවා ව්‍යාජ තොරතුරු බාල භාණ්ඩ සැපයීමෙන් සිදුවන අසහනයන්ට වන්දි හෝ සහන ලබා ගැනීමට ඇති අයිතියයි.

07) පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය.

නැණවත් පාරිභෝගිකයකු වශයෙන් කටයුතු කිරීමට අවශ්‍ය දැනුම සහ කුසලතා ලබා ගැනීමට ඇති අයිතියයි.

08) සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත්වීමට ඇති අයිතිය.

පුද්ගලයින්ගේ ජීවිතයට අනතුරුදායක හෝ තර්ජනාත්මක නොවන අභිමානවත් සහ යහපත් දිවිපෙවෙතක් ගත කිරීමට ඉඩ සලසන්නා වූ පරිසරයක ජීවත්වීමට හා රැකියාවක් කිරීමට ඇති අයිතියයි.

## පාරිභෝගික වගකීම් / යුතුකම්

නීතියෙන් සලසා ඇති පාරිභෝගික අයිතිවාසිකම් රැක ගැනීම සඳහා සංවිධානය වීම හා ක්‍රියා ක්‍රියාත්මක වීමේ යුතුකමයි. පාරිභෝගික ජාත්‍යන්තරය විසින් ප්‍රකාශයට පත් කරන ලද පාරිභෝගික වගකීම් කිහිපයකි.

**01** විචාරාත්මක දැනුවත්භාවය
භාණ්ඩ හා සේවාවන්හි ගුණත්වය හා මිල පිළිබඳ ප්‍රශ්න කිරීම සහ සෝදිසියෙන් සිටීමයි

**02** සක්‍රිය සහභාගිත්වය
යුක්ති සහගත සහ සාධාරණ ගනුදෙනු සඳහා ක්‍රියා කිරීම සහ පාරිභෝගික අයිතීන් සහ බලය තහවුරු කිරීමට කටයුතු කිරීමයි.

**03** සමාජය ගැන සැලකිලිමත් වීම
අපගේ පරිභෝජන රටාවන් අනිකුත් පුද්ගලයන්ට සහ කණ්ඩායම් වලට ඇතිවන බලපෑම් පිළිබඳව සැලකිලිමත් වීමයි.

**04** පරිසරය පිළිබඳව සැලකිලිමත් වීම / පාරිසරික දැනුවත්භාවය
අනාගත ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීම සඳහා අපගේ පාරිභෝගික රටාවන් පරිසරයට වන බලපෑම් පිළිබඳව සැලකිලිමත් වීමයි.

**05** සහයෝගීතාවය / එක්සත්ව කටයුතු කිරීම.
පාරිභෝගික ආරක්ෂණය නැන්වීමට බලපෑම් කිරීම සඳහා පාරිභෝගිකයින් එක්සත්ව සංවිධානය වීමයි.

## පාරිභොගිකයින් පාරිභෝගික වගකිම් ඉටුකිරිම තුළින් ඉටුවන පාරිභෝගික අයිතිවාසිකම්

| පාරිභෝගික වගකීම් | පාරිභෝගික අයිතිවාසිකම් |
|---|---|
| ක්‍රියාකාරී සහභාගිත්වය | ආරක්ෂාව සලසා ගැනීම<br>වන්දි ලබාගැනීම |
| විචාරාත්මක දැනුවත්භාවය | තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය |
| සහයෝගීතාවය | ආරක්ෂාව සලසා ගැනිම<br>වන්දි ලබාගැනීම |
| සමාජය ගැන සැලකිලිමත් විම | මූලික අවශ්‍යතා සපුරා ගැනිම<br>සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත්වීම |
| පාරිසරික දැනුවත්භාවය | සෞඛ්‍යසම්පන්න පරිසරයක ජීවත්වීම |

## පාරිභෝගික අධ්‍යාපනය තුළින් පාරිභෝගිකයන් ආරක්ෂා වන ආකාරය

1) ගෙවන මුදලට සරිලන වටිනාකමකින් යුත් භාණ්ඩ තොරා ගනීමට පෙළඹිම.

2) ප්‍රමිතියෙන් ඉහළ භාණ්ඩ තෝරා ගැනීමට පෙළඹිම.

3) වෙළෙඳ විෂමාචාර හා පාරිභෝගික අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ ව අදාළ බලධාරීන් දැනුවත් කර අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරයි.

4) තමා ජීවත්වන පරිසරය ආරක්ෂා කර ගනිමට කටයුතු කිරිම.

5) සමාජය පිළිබඳ සැලකිලිමත් වෙමින් කටයුතු කිරිම.

6) අන් පාරිබෝගිකයින් සමග සහයෝගයන් කටයුතු කරිම.

7) තාර්කික පාරිභෝගිකයෙකු ලෙස වෙළෙඳපොළේ හැසිම නිසා.

8) පාරිභෝගිකයකු වශයෙන් තමා සතු යුතුකම් නිසි ලෙස ඉටු කිරීමෙන්.

## පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග

01) ශක්තිමත් පාරිභෝගික ආරක්ෂණ නිති ස්ථාපිත කිරීම.

උදාහරණ:- පාරිබොගික කටයුතු පිළිබද අධිකාරි පනත
ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත

02) බලසම්පන්න පාරිබෝගික ආරක්ෂක ආයතන පිහිටුවිම.

උදාහරණ:- පාරිබෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

03) වෙළෙඳපොළ පදනම් කරගත් පාරිභෝගික ආරක්ෂණ වැඩපිළිවෙළවල් කරා යොමු විම.

උදාහරණ:- භාණ්ඩ හා සේවා වල උපරිම සිල්ලර මිල ගණන් නියම කිරීම.

ගුණත්වය සඳහා ප්‍රමිතීන් නියම කිරීම

ඇසුරුම් දැක්විය යුතු තොරතුරු නියම කිරීම

නිවිත භාණ්ඩ වර්ග නම් කිරීම

04) කර්මාන්තය පදනම් කරගත් පාරිභෝගික ආරක්ෂණ වැඩපිළිවෙළවල් සඳහා ප්‍රතිපත්ති සම්පාදනය

උදාහරණ:- තත්ව පාලන පද්ධති

ආචාර ධර්ම පද්ධති

ස්වයං පාළන ක්‍රියා පිළිවෙත්

05) වෙළෙඳපල සැපයුමට මැදිහත්වීම

06) පාරිභෝගික අධ්‍යාපනය නගා සිටුවිම

07) පාරිභෝගික සංවිධාන පිහිටුවීමට අනුබල දිම

## පාරිභෝගික ආරක්ෂණය සඳහා ව්‍යාපාර ආයතනයකට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග

01) ව්‍යාපාර ආචාරධර්ම සංග්‍රහයක් ස්ථාපිත කිරීම

02) වගකීම වර්ධනය කිරීම

03) විනිවිදභාවයෙන් යුක්තව කටයුතු කිරීම

04) වගකීම් සහතිකයක් නිකුත් කිරීම

05) ලේබලයක් මගින් අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරිම

06) බිල්පතක් ලබා දීම

07) සන්නම් නාමයක් යටතේ භාණ්ඩ වෙළඳ පොළට ඉදිරිපත් කිරීම

08) ජාතික හා අන්තර්ජාතික ප්‍රමිති ලබා ගැනිම

## පාරිභෝගිකයකුට ස්වකීය ආරක්ෂාව සලසා ගැනීම සඳහා අනුගමනය කල හැකි ක්‍රියාමාර්ග

01) ජාතික හා අන්තර්ජාතික ප්‍රමිති සහතිකය සහිත භාණ්ඩ මිලදි ගැනිම

02) ලේබලය පරීක්ෂා කොට බලා භාණ්ඩ මිලදී ගැනීම

03) ප්‍රකට සන්නම් නාමයක් සහිත භාණ්ඩ මිලදී ගැනීම

04) විශ්වාසවන්ත වෙළඳසැල් වේතින් භාණ්ඩ මිලදී ගැනිම

05) පාරිභෝගික සංවිධාන පිහිටුවා ගැනීම

06) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත යටතේ පාරිභෝගික ආරක්ෂා සලසා ගැනිම

07) ආරක්ෂා සඳහා සලසා ඇති විධිවිධාන අවබෝධ කරගැනීම

උදාහරණ:- බිල්පතක් ඉල්ලා සිටීම

වගකීම් සහතිකයක් ලබාගැනීම

## පාරිභෝගිකයකුට පාරිභෝගික ආරක්ෂාව සැලසෙන ප්‍රධාන ක්‍රම

01) ස්වං ආරක්ෂාව

02) පාරිභෝගික සංවිධාන තුළින් ලැබෙන ආරක්ෂාව

03) රාජයේ නීති රීති හා අණපනත් මගින් ලැබෙන ආරක්ෂාව

- **මෙයින් වඩාත් පලදායී ක්‍රමය වන්නේ ස්වං ආරක්ෂාව සලසා ගැනීමයි**

## පාරිභෝගික ආරක්ෂණයේ මට්ටම්

- පුද්ගලික මට්ටම - ස්වයං ආරක්ෂාව සලසා ගැනීම
- ප්‍රාථමික මට්ටම් /ප්‍රාදේශීය මට්ටම - පාරිභෝගික සංවිධාන හරහා ආරක්ෂාව සලසා ගැනීම
- ද්විතික මට්ටම /ජාතික මට්ටම - නීතිරීති අණපනත් හරහා ආරක්ෂාව සලසා ගැනීම
- තෘතික / ජාත්‍යන්තර මට්ටම - පාරිභෝගික ජාත්‍යන්තරය වැනි ජාත්‍යන්තර ආයතන හරහා ආරක්ෂාව සලසා ගැනීමයි

## පාරිභෝගික අධ්‍යාපනය

නැණවත් පාරිභෝගිකයකු වශයෙන් කටයුතු කිරීමට අවශ්‍ය දැනුම කුසලතා ලබා ගැනීමයි. එනම් පාරිභෝගිකයකු සතු අයිතිවාසිකම් සහ ඔහුගේ වගකීම් යනාදිය පිළිබඳ තොරතුරු සැපයීමෙන් ඔහුව දැනුවත් කිරීමයි.

නිපුණතා මට්ටම 3.6 : පාරිභෝගික ආරකෂ්ණය සඳහා කිය්‍රාතමක වන රාජ්‍ය ආයතනවල කාර්යභාරය විමසා බලයි.

ඉගෙනුම් ඵල :

- ශ්‍රී ලංකාවේ පාරිභෝගික ආරක්ෂණය සඳහා කටයුතු කරන රාජ්‍ය ආයතන ලැයිස්තගත කරයි.
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුණු හා කාර්ය විස්තර කරයි.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අරමුණු හා කාර්ය විස්තර කරයි.
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ව්‍යාපාරවලට වැදගත් වන ආකාරය පෙන්වා දෙයි.

**ක්‍රියාකාරකම....... 06**

- කල් ඉකුත් වීමේ දිනය ඉක්මවා ඇති/කල් ඉකුත් වීමේ දිනය සඳහන් නො වන, මිල වෙනස් කරන ලද හා ප්‍රමිති ලාංඡන සහිත (SLS ,ISO) භාණ්ඩ ඇසුරුම් කිහිපයක් පන්තියේ සිසුන්ට නිරීක්ෂණය කිරීමට ලබා දෙන්න.
- එම ඇසුරුම්වලින්, එම භාණ්ඩය පිළිබඳ ව පාරිභෝගිකයින්ට ලබා ගත හැකි තොරතුරු සිසුන්ගෙන් විමසන්න.
- එම ඇසුරුම්වල සඳහන් තොරතුරුවලින් උල්ලංඝනය වී ඇති පාරිභෝගික අයිතිවාසිකම් මොනවා දැයි විමසන්න. (තොරතුරු දැන ගැනීමේ අයිතිය, ආරක්ෂාව සලසා ගැනීමේ අයිතිය )
- නිෂ්පාදකයින්/වෙළෙන්ඳන් විසින් සිදු කර ඇති වෙළෙඳ විෂමාචාර මොනවා දැයි විමසන්න. (මිල වෙනස් කර තිබීම, කල් ඉකුත් වීමේ දිනය ඉක්මවා ඇති භාණ්ඩ විකිණීම, කල් ඉකුත් වීමේ දිනය සඳහන් නො වීම)
- එවැනි වෙළෙඳ විෂමාචාර පිළිබඳ ව දැනුම් දිය හැකි ආයතන සිසුන් සමග සාකච්ඡා කරන්න.
- පාරිභෝගික ආරක්ෂාව සඳහා කටයුතු කරන ආයතන පවතින බව සාකච්ඡා කරන්න.
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුණු හා කාර්යයන් හඳුන්වා දෙන්න.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අරමුණු හා කාර්යයන් පැහැදිලි කරන්න.
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ව්‍යාපාරවලට වැදගත් වන ආකාරය සාකච්ඡා කරන්න.

## පාරිභෝගික ආරක්ෂණය සඳහා කටයුතු කරන දේශිය ආයතන

01) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.

02) පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව.

03) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය.

04) මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව.

05) මධ්‍යම පරිසර අධිකාරිය.

06) ප්‍රාදේශිය සෞඛ්‍යය වෛද්‍ය නිලධාරි කාර්යාලය.

07) දිස්ත්‍රික් ලේඛම් කාර්යාලය.

## පාරිභෝගික යුතු පිළිබඳ අධිකාරිය

❖ පාරිභෝගිකයන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සහ සාධාරණ වෙළඳපල තරගකාරීත්වයක් ඇති කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රධාන බලදාරි ආයතනයයි.

❖ 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත යටතේ මෙය පිහිටුවා ඇත.

❖ සදාචාරාත්මක ව්‍යාපාර පරිසරයක් තුළ සුරක්ෂිත වූ පාරිභෝගිකයකු බිහි කිරීම මෙහි දැක්ම වේ.

## පාරිභෝගික යුතු පිළිබඳ අධිකාරියේ සංයුතිය

අධිකාරියේ සභාපතිවරයෙකු ගෙන් සහ කර්මාන්ත, නිතිය, ආර්ථිකය විද්‍යාව, වාණිජ්‍ය, පරිපාලනය, ගිණුම්කරණය, විද්‍යාව හා සෞඛ්‍ය යනාදී ක්ෂේත්‍රවල සුදුසුකම්ලබා ඇත්තා වූද ඒ ඒ ක්ෂෙත්‍ර වල පෘථුල පළපුරුද්දක් හා විශිෂ්ටත්වයක් ලබා ඇත්තාවූද තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත්කරන ලද 10කට නොඅඩු සාමාජිකයෙක් සංඛ්‍යාවක ගෙන් සමන්විත වේ එහි සභාපතිවරයාට අමතරව වෙනත් සාමාජිකයින් තිදෙනකු පූර්ණ කාලීණ සාමාජිකයින් ලෙස පත් කරන අතර ඔහුන් ඇතුලු සියලු දෙනා අවුරුදු 03ක කාල සීමාවකට පත් කරන අතර සභාපතිට අමතරව මෙහි අධ්‍යක්ෂක ජෙනරාල් වරයෙක් සිටි. ඔහු අධිකාරියේ ලේකම්වරයා වේ.

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුණු

01) පාරිභෝගික ජීවිත හා දේපලවලට හානි කරවන භාණ්ඩ හා සේවා සැපයීමට එරෙහි වීම.

02) පාරිභෝගිකයා ආරක්ෂා කිරිම සහ පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ සැළකිලිමත් වීම.

03) හැකි සෑම විටම තරගකාරී මිලට භාණ්ඩ හා සේවා ලබාදීමට කටයුතු කිරීම.

04) අසාධාරණ වෙළද පිළිවෙත් මගින් සිදුකරන පාරිබොගික සූරාකැම් වලට එරේහිව සහනයක් ලබාදීම.

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යයන්

01) වෙළඳුන් අතර සීමාකාරී වෙලද ගිවිසුම් පාලනය කිරිම.

02) ඒකාදිකාරී තත්ත්වයන් පාලනය කිරීම.

03) අහිතකර තරගකාරීත්වය වැළැක්වීම.

04) පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

05) පාරිභෝගික සංවිධාන පිහිටුවීම අනුබල දීම.

06) පාරිභෝගික අධ්‍යාපනයය ප්‍රවර්ධනය කිරීම.

## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)

ශ්‍රී ලංකාවේ ප්‍රමිති කරණ කටයුතු ප්‍රචලිත කිරීම සහ කර්මාන්ත ආශිත ක්ෂෙත්‍රයන් හි තත්ව කළමනාකරණ කටයුතු ප්‍රචලිත කිරීම සඳහා ආරම්භ කොට ඇති ආයතනයයි.

1964 අංක 38 දරණ ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යංශ පනතින් ස්ථාපිත කල ප්‍රමිති කාර්යාංශය 1984 අංක 6 දරණ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත හඳුන්වා දීමෙන් පසු ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නමින් ක්‍රියාත්මක වේ.

- ප්‍රමිති කරණයේ පියා ඇමරිකානු ජාතික එලී විට්නි මහතා ය.
- ලෝක ප්‍රමිති දිනය ඔක්තෝම්බර් 14 සැමරෙයි.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අන්තර්ජාතික ප්‍රමිති ආයතනයේ ශ්‍රී ලංකාවේ ජාතික සාමාජික ආයතනයයි.

## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අරමුණු

නිෂ්පාදන ක්‍රියාවලිය හා සැකසීම පිළිබඳ ව ජාතික හා අන්තර්ජාතික පදනම මත ප්‍රමිති පිළියෙල කිරීම.

කාර්මික හා වාණිජ් කෂේත්වල පම්‍රිතකිරණ සහ තතත්ව් පාලනය පවර්ධනය කිරීම හා ඒ සඳහා රසායනාගාර හා පුස්තකාල සේවා පිහිටුවා පවත්වා ගෙන යාම.

දෙශ්යී නිෂපාදිත මෙන ්ම ආනයනය කරන ලද භාණ්ඩ පම්‍රිතවිලට අනකුලූ ද යන්න පරීක්ෂා කිරීම.

ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලන කටයුතු සඳහා පර්යේෂණ පහසුකම් සැපයීම.

ප්‍රමිති සහතික සලකුණු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

ජාත්‍යන්තර ප්‍රමිති ආයතන හා ඒ සමාන කටයුතුවල යෙදෙන සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

අධ්‍යාපනය, උපදේශනය හා වෙනත් මාර්ගවලින් ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලන කටයුතු දිරිගැන්වීම.

## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කාර්යයන්

1) ප්‍රමිති පිළියෙල කිරීම.

2) ප්‍රමිති ක්‍රියාත්මක කිරීම.

- ස්වේච්ඡාවෙන්.
- SLS සහතික ලාංඡන ක්‍රමය මගින්.
- පූර්ව අපනයන පරීක්ෂාව මගින්.
- ආනයන පරීක්ෂාව මගින්.
- අපනයන පිළිබඳ පිළියෙල කළ මුහුදු ආහාර පරීක්ෂාව මගින්.

3) ISO ප්‍රමිති ක්‍රියාත්මක කිරීම.

4) ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය පිළිබඳ පුහුණු පාඨමාලා සංවිධානය කිරීම.

5) ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලන ප්‍රවර්ධන කටයුතු.

6) උපකරණ ක්‍රමාංකන සේවා.

පාරිභෝගික අධ්‍යාපනය ප්‍රචලිත කිරීම.

පුස්තකාල සේවාව, දේශීය විදේශීය ප්‍රමිති අලෙවිය සහ තොරතුරු සේවා.

තත්ත්ව පද්ධති පිළිබඳ අන්තර්ජාතික ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම

## <u>ව්‍යාපාරවලට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වැදගත් වන ආකාරය.</u>

SLS ලකුණ සහිත නිෂ්පාදිත අලෙවි කිරීම තුළින් තරඟකාරිත්වයට සාර්ථක ව මුහුණ දිය හැකි වීම.

SLS ලකුණ නො මැති නිෂ්පාදන ආයතන අභිබවා නියම වශයෙන් වාසිදායක තත්ත්වයක් ලැබිය හැකි වීම.

පාරිභෝගික පැමිණිලි අවම කර ගත හැකි වීම.

රාජ්‍ය අංශය SLS  සලකුණ සහිත භාණ්ඩ මිල දී ගැනීමට ප්‍රමුඛත්වයක් දෙන බැවින් වෙළෙඳපොළ කොටස පුළුල් කර ගත හැකි වීම.

විදේශ සහතික කිරීමේ සලකුණු (ISO) ලබා ගැනීම තුළින් විදේශ  වෙළෙඳපොළේ දී සාර්ථක වීමට ඉඩ ලැබීම.

ප්‍රමිතීන් තුළ පාරිභෝගික අවශ්‍යතා හා නෛතික අවශ්‍යතා ඇතුළත් වන බැවින් නිෂ්පාදිත පිළිබඳ පිළිගත හැකි මට්ටම ඉහළ යාම.

නාස්තිය අවම වී ඵලදායීතාව වර්ධනය වීම.

ආයතනයේ ප්‍රතිරූපය වර්ධනය වී සේවක චිත්ත ධෛර්ය වර්ධනය වීම.

## <u>ශ්‍රී ලංකා ජාතික තත්ත්ව සම්මානය</u>

විශිෂ්ට තත්වයෙන් යුත්තව භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන සුළු මධ්‍ය හා මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් වාර්ෂිකව පිරිනමනු ලබන සම්මානයයි. ශ්‍රී ලාංකීය සංවිධානවල විශිෂ්ට තත්ව කළමනාකරණ ක්‍රියාවලින් පිළිගැනීමට ලක්කරන වාර්ෂික වැඩ පිළිවෙළයි.

## ප්‍රමිති

නිෂ්පාදනයේත්, පාරිභෝජනයේත්, වෙළඳාමේත්, උපරිම කාර්යක්ෂමතාව උදෙසා විද්‍යාවේත්, තාක්ෂණයේත්, පළපුරුද්දේත්, ඒකාබද්ධ ප්‍රතිඵල කැටි කොට අදාල සියලුම අංශවල පොදු අනුමැතියෙන් සහ ඒකමතික භාවයෙන් යුක්තව පිළියෙල කොට ජාතික, කලාපීය හෝ අන්තර්ජාතික වශයෙන් පිළිගත් ආයතනයක් විසින් අනුමත කර මහජනයා වෙත ඉදිරිපත් කරනු ලබන තාක්ෂණික පිරිවිතරයකි.

## ප්‍රමිතියකින් අත්වන ප්‍රතිලාභ

S - Saving money — මුදල් ඉතිරි වීම.

T - Time saving — කාලය ඉතිරි විම.

A - Accident prevention — අනතුරු වැලකීම.

N - No bais — අපක්ෂපාතී බව.

D - Defind quality — තත්ත්වය අර්ථ දැක්වීම.

A- Argument avoided — අවිවාදයෙන් මිලදී ගත හැකිවීම.

R- Reliability assurvd — විශ්වාසය තහවුරු වීම.

D- Delivery in time — නිසි වෙලාවට බෙදා හැරීම.

S - Saving resources — සම්පත් ඉතිරිවීම.

## ජාතික ප්‍රමිති පද්ධතියක් ක්‍රියාත්මක කිරීමෙන් රටට අත්වන ප්‍රතිලාභ

01 ගුණාත්මක නිෂ්පාදිත නිපදවීමට හැකියාව ලැබීම.
02 අපතනය සහ නාස්තිය අවම වීම.
03 පාරිභෝගික ආරක්ෂාව තහවුරු වීම.
04 පාරිභෝගික සෞඛ්‍යය තහවුරු විම.
05 පාරිභෝගික දැනුවත් භාවය තහවුරු විම.
06 රටේ සම්පත් කාර්යශමව උපයෝජනය වීම.
07 අපනයනය වර්ධනය කරගත හැකිවීම.

## ප්‍රමිතිකරණය

විද්‍යාව, තාක්ෂණය, ආර්ථිකය යන ක්ෂෙත්‍රයන්හි හට ගන්නා ප්‍රශ්න සඳහා නැවත නැවතත් යෙදිමට හැකි යෝග්‍යතම විසදම් ක්‍රියාපිළිවෙල ප්‍රමිතිකරණයයි.

මෙහි ප්‍රධාන අංග 03කි

01 ප්‍රමිති සකස් කිරීම.
02 ප්‍රමිති නිකුත් කිරීම.
03 ප්‍රමිති ක්‍රියාත්මක කිරීම.

## ප්‍රමිතිකරණයේ මට්ටම්

01) පුද්ගල ප්‍රමිති

යමෙක් එදිනෙදා කටයුතු ක්‍රමානුකූලව කරගෙන කරගෙන යාම සඳහා පිළියෙල කරන ප්‍රමිති වේ. ඕනෑම පුද්ගලයෙකුට තම කාර්යයන් ක්‍රමවත්ව කර ගැනීම සඳහා තමාට ආවේණික පුද්ගල ප්‍රමිති සකස් කරගත හැකිය.

උදාහරණ:- පාසල් ශිෂ්‍යයකු තම එදිනෙදා කටයුතු ක්‍රමානුකූලව පවත්වා ගෙන යාමට භාවිතා කරන කාලසටහන්

02) සමාගම් ප්‍රමිති

කිසියම් ආයතනයක හෝ සමාගමක සියලුම ක්‍රියාවන් සඳහා සකස් කරගත් ප්‍රමිති වේ. මේවා අභ්‍යන්තර ප්‍රමිති ලෙස හඳුන්වයි. නිරවුල් භාවය ඇති කරගැනිම, පිරිවැය අඩුකර ගැනීම, ඵලදායිතාව වැඩි කර ගැනිම මෙම ප්‍රමිති වල අරමුණු වේ.

03) කර්මාන්ත ප්‍රමිති

යම් ක්ෂේත්‍රයකට අයත් නිෂ්පාදකයින් හා වෙළඳුන් එක්තු වී සකස් කරගත් ප්‍රමිති වේ.

උදාහරණ:- ශ්‍රී ලංකාවේ ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ සංගමය විසින් සකස් කර ඇති ප්‍රමිති

04) ජාතික ප්‍රමිති

කර්මාන්ත හා වානිජ්‍යයේ යොදා ගැනීම සඳහා සකස් කර ගන්නා ප්‍රමිති වේ. ශ්‍රී ලංකාවේ දී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් මෙවා පිළියෙල කරයි.

උදාහරණ:- SLS

05) කලාපීය ප්‍රමිති

රටවල් කිහිපයක් එක්තු වී සකස් කරන ප්‍රමිති වේ.

උදාහරණ:- යුරෝපා සංගමයට අයත් ප්‍රමිති

06) අන්තර් ජාතික ප්‍රමිති

අන්තර් ජාතික වශයෙන් භාණ්ඩ හුවමාරුව නිරාකරණය කිරීම, සන්නිවේදනය පහසු කිරීම, පාරිභෝගික ආරක්ෂාව සැලසීම, අන්තර්ජාතික වෙළඳාමට ඇති බාධක ඉවත් කිරීම ආදී අරමුණු ඇතිව සකස් කරන ලද ප්‍රමිති වේ.

උදාහරණ:- ISO ප්‍රමිති

## ප්‍රමිතිකරනයේ අරමුණු

01 රටක සමස්ත ආර්ථික සංවර්ධනය
02 පාරිභෝගික ආරක්ෂාව
03 පාරිභෝගික සෞඛ්‍ය ආරක්ෂාව
04 සන්දේශන වර්ධනය

## ශ්‍රී ලංකා ප්‍රමිතිය ආයතනය විසින් ප්‍රමිති ක්‍රියාත්මක කරන ආකාරය

01) ස්විචාවේන් පිළිපැදීම මගින්

ප්‍රමිතිවලට අනුකූලව භාණ්ඩ නිෂ්පාදනය බලපෑමක් නොමැතිව නිශ්පාදකයා කැමැත්තෙන්ම සිදු කිරීමයි.

02) SLS භාණ්ඩ සහතික කරනයේන්

03ආනයනික පරීක්ෂාව මගින්

මෙරටට ආනයනය කරන ලද භාණ්ඩ වෙළෙඳ පොළට නිකුත් කිරීමට පෙර ප්‍රමිති ආයතනය මගින් සිදුකර ගත යුතු පරීක්ෂාවයි.

04) පූර්ව අපනයන පරීක්ෂණ මගින්

ව්‍යාපාර කෘෂි නිෂ්පාදන අපනයනය කිරීමට පෙර ස්වේච්චා පදනමකින් ප්‍රමිති ආයතනය මගින් කරවා ගත යුතු පරීක්ෂාවයි.

05) අපනයනය සඳහා මුහුදු ආහාර ඇසුරුම් ආයතන පරීක්ෂාව මගින්

අපනයනය කරන මුහුදු ආහාර සඳහා අවශ්‍ය සෞඛ්‍ය සහතික ලබාගැනීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේන් ලබා ගත යුතු ඇසුරුම් කරන පරික්ෂාවයි.

## ශ්‍රී ලංකා ප්‍රමිතිය ආයතනය විසින් ක්‍රියාත්මක කරන ප්‍රමිති

01) SLS භාණ්ඩ සහතිකරණය.

02) ISO 9001-2015 තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකකරණය.

03) ISO 14001-2015 පරිසර කලමනාකරණ පද්ධති සහතිකකරණය.

04) ISO 22000-2005 ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති සහතිකකරණය.

05) ISO 50001-2011 බලශක්ති කළමනාකරණ පද්ධති සහතිකකරණය.

06) ISO 26000-2010 සමාජ වගකීම් මාර්ගෝපදේශය.

07) SA-8000 සමාජ වගකීම් පිළිබඳ සහතිකකරණය.

08) ISO 18001-2007 වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති සහතිකකරණය.

09) HACCP සහතිකකරණය
උපද්‍රව විශ්ලේෂණ හා අවධි පාලන අවස්ථා

10) GMP සහතිකකරණය.
යහපත් නිෂ්පාදන පරිචයන් සහතිකකරණය.

11) ISO 27001-2013 තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධති සහතිකකරණය.

12) තේ නිපැයුම් සහතිකකරණය. (PST)

13) සුපිරි වෙළඳසැල් කළමණාකරන සහතිකකරණය. (SMCS)

14) කාබනික කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රියාවලි පද්ධති සහතිකකරණය.

15) නිර්මාංශ ආහාර පද්ධති සහතිකකරණය.

16) ශක්ති කාර්යක්ෂමතා ලේබලය.

17) විදාතා පද්ධති සහතිකකරණය.

## SLS භාණ්ඩ සහතිකකරණය.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට අනුකූලව භාණ්ඩ නිෂ්පාදනය කර ඇති බවට එම ආයතනය විසින් නිකුත් කර ඇති සහතිකයයි. මෙමගින් භාණ්ඩයේ ගුණත්වය පිළිබඳ තෙවන පාර්ශවයේ වගකීමක් දෙනු ලැබේ.

## SLS ලාංඡන ක්‍රමය සිය නිශ්පාදිත සඳහා ලබාගැනීමට නිෂ්පාදකයකු සපුරාලිය යුතු මූලිකාංග

01) නිවැරදි ක්‍රියාවලින් පාලනයක් පැවතීම.

02) නිවැරදි කළමනාකරණයය ක්‍රමයක් පැවතීම.

03) නිවැරදි ඇසුරුම් ක්‍රමයක් පැවතීම.

04) නිවැරදි සේවක පුහුණු කිරීමේ ක්‍රමයක් පැවතීම.

05) නිවැරදි තත්ව පාලන ක්‍රමයක් පැවතීම.

06) තත්ව පාලන වාර්තා පවත්වාගෙන යාම.

07) අභ්‍යන්තර තත්ව විගණන ක්‍රමයක් පවත්වාගෙන යාම.

## SLS ලාංඡනය පිරිනැමීමේ පරමාර්ථ

01) දේශීය නිෂ්පාදිතයන්ගේ ගුණත්වය ඉහළ නැංවීමට.

02) ගුණත්වයෙන් ඉහල භාණ්ඩ හඳුනා ගැනීමට පාරිභෝගිකයාට උදව් කිරීම.

03) ගුණත්වයෙන් ඉහළ භාණ්ඩ නිෂ්පාදනයටත් ඒවායේ තත්ත්වය රැක ගැනීමටත් නිශ්පාදකයා උනන්දු කිරීම.

## SLS ලාංඡන ක්‍රමය මගින් නිෂ්පාදකයාට අත්වන වාසි

01) විකුනුම් වර්ධනය වීම

02) ගුණාත්මකභාවය වැඩි වීම තුළින් කීර්තිනාමය ඉහළ යාම

03) ප්‍රවර්ධනය පහසුවීම

04) තරගයට සාර්ථකව මුහුණ දිය හැකි වීම

05 අපතනය සහ නාස්තිය අවම වීම
06 ලාභය ඉහළ යාම

## SLS ලාංඡන ක්‍රමය මගින් පාරිභෝගිකයාට ප්‍රතිලාභ

01) තෝරා ගැනීම පහසු වීම

02) ගෙවන මුදලට සරිලන තෘප්තියක් ලබාගත හැකිවීම.

03) පාරිභෝගික ආරක්ෂාව තහවුරු වීම.

04) ගුණයෙන් උසස් භාණ්ඩ පරිභෝජනය කිරීමට අවස්ථාව හිමිවීම

## SLS ලාංඡනය අනිවාර්ය භාණ්ඩ වර්ග

01) ආහාර නිෂ්පාදිත

| | |
|---|---|
| දුඹුරු සීනි | ටින් මාලු |
| උකු කිරි | නැවුම් පලතුරු කෝඩියල් |
| පලතුරු රස පාන වර්ග | පිළිගැන්වීමට සූදානම් කරන පලතුරු බීම |

02) විදුලි උපකරණ

| | |
|---|---|
| ගෘහස්ථ උදුන් තැටි | විදුලි බල්බ |
| ගෘහස්ථ විදුලි පහන් හොල්ඩර් | ගෘහස්ථ විදුලි ස්විච් |

03) සිමෙන්ති හා සිමෙන්ති නිශ්පාදිත

සාමාන්‍ය පොට්ලන්ඩ් සිමෙන්ති

හුණු ගල් මිස්ත්‍ර සිමින්ති

මේසන් සිමින්ති

හයිඩොලික් සිමෙන්ති

සිමින්ති බ්ගල්

04) වානේ නිෂ්පාදන

කොන්ක්‍රීට් ශක්තිමත් කිරීම සඳහා වූ මෘදු වානේ දඬු

කොන්ක්‍රීට් ශක්තිමත් කිරීම සඳහා වූ දාර සහිත වානේ දඬු

කම්බි කණු සඳහා මෘදු වානේ කම්බි

U වානේ දඬු

T වානේ දඬු

L වානේ දඬු

05) වෙනත් නිෂ්පාදන

PVC පයිප්ප

PVC පයිප්ප සන්ධි සහ උපාංග

දත් බුරුසු

දන්තාලේප

මැටි සෙවිලි උළු

මැටි මුදුන් උළු

මදුරු දගර

මදුරු මැටි

Good Luck

All The Best…………

# A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."